# ෆෙඩ්රික් විලියම් ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන දර්ශනය

ඉඹුලමුරේ විමලරතන හිමි

## හැඳින්වීම

ෆෙඩ්රික් විලියම් ෆ්‍රොබෙල් යනු දරුවන්ට අද්විතීය අවශ්‍යතා සහ හැකියා පවතින බව දක්වමින් නූතන පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ පදනම දැමූ ජර්මානු අධ්‍යාපනඥයෙකි. එහෙයින්ම ඔහු 'ළදරු පාසලේ පියා' යන අන්වර්ථ නාමයෙන් වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත. ඔහුගේ අධ්‍යාපන දර්ශනයෙන් පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සංකල්පය හා ඒ සඳහා සුවිශේෂ ස්ථානයක අවශ්‍යතාවය පැහැදිලි කරයි. ස්වභාවධර්මය සහ මනුෂ්‍යත්වය පිළිබඳ ගවේශකයෙකු වූ ෆ්‍රොබෙල් අධ්‍යාපනය පිළිබඳව ජීව විද්‍යාත්මක හා අධ්‍යාත්මික දෘෂ්ටිකෝණයකින් කටයුතු කළ බව ඔහුගේ අධ්‍යාපනික සංකල්ප හා භාවිතා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වෙයි. ඔහුට අනුව ජීවියාගේ අනාගත ජීවිතයේ ගොඩනැගීම් හා සංවර්ධනය ඔහුගේ පැවැත්මේ ආරම්භය වන පූර්ව ළමාවියේදීම සිදුවන්නකි. ඒ අනුව ක්‍රීඩාවෙන් ඉගෙනුම, ෆ්‍රොබෙල්ගේ කුසලතා, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංකල්පය (Kindergarten) හා චලනයේ වැදගත්කම ආදී සුවිශේෂ සංකල්ප හා භාවිතාවන් අධ්‍යාපන ක්‍රියාවලියට එක් විය. මෙම ලිපියෙන් පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ෆ්‍රොබෙල්ගේ දාර්ශනික සංකල්ප හා භාවිතාව පිළිබඳව අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## සාකච්ඡාව

ෆෙඩ්රික් ෆ්‍රොබෙල් ක්‍රි.ව. 1782 දී ජර්මනියේ උපත ලැබීය. (Baidya, et al, 2015:135). ඔහු යුරෝපයේ වැඩවසම් ක්‍රමය, ධනවාදයට හැරුණු සමාජ හා දේශපාලන කැලඹීම්වලින් යුක්ත පසුබිමක ජීවත් විය. පූජකයකුගේ පුතෙකු වන ෆ්‍රොබෙල්ගේ වයස අවුරුදු අටේදී ඔහුගේ මව කලුරිය කළාය (Reinhold, et al, 2013:1). මවගේ අභාවයෙන් පසු ඔහුගේ පියා නැවත විවාහ විය. මෙය කුඩා ෆ්‍රොබෙල්ට දැඩි ලෙස බලපෑ අතර ඔහු මානසික කැළඹීම්

සහිත සිසුවෙකු විය. මේ නිසා ඔහු හුදෙකලා ළමා කාලයක් ගත කළේ ය (Tovey, 2013: 12, Weston, 2000:2). ඔහුගේ මෙම හුදෙකලා ළමාවිය ඔහුව ගැඹුරු අභ්‍යන්තර නිරීක්ෂණවලට යොමු කළේ ය. ඒ අනුව දෙමාපියන්ගේ ආදරය සහ සෙනෙහස අහිමිවීම ම ෆ්‍රොබෙල් ස්වභාවධර්මයේ මිතුරෙකු වීමට හේතු විය (Froet, 2010:479). ඔහුගේ ස්වයං ලිඛිත චරිතාපදානයේ එය මෙසේ දක්වා ඇත. ''මට හැඟෙන පරිදි ශාක හා මල් සහිත ලෝකය, මා හට නිරීක්ෂණයට හා සිතීමට යොමු කළ චින්තනමය වස්තූන් බවට පත් විය'' (Weston, 2000:7). ෆ්‍රොබෙල් වයස අවුරුදු දහයේදී මාමාගේ භාරකාරත්වයට පත්වූ අතර එමගින් ඔහු ආදරය හා සෙනෙහස හඳුනා ගත්තේ ය (ෆ්‍රොබෙල්, 1886:9). ෆ්‍රොබෙල්ගේ ළමාවිය හුදකලා වුව ද නිදහසේ ගතවූ අතර ළමාවියේදී පවුල් දෙකකින් ලැබූ එකිනෙකට පරස්පර ජීවන අත්දැකීම් ඔහුගේ පසුකාලීන අධ්‍යාපන දර්ශනයට සුවිශේෂ බලපෑමක් කළේ ය (Weston, 2000:2). ෆ්‍රොබෙල් වයස අවුරුදු පහළොවේදී හර්විට්ස් නම් වනසංරක්ෂණ නිලධාරියකුට අත් උදව්කරුවෙකු ලෙස සේවය කළ අතර එහිදී ඉඩම් මැනීම හා සම්බන්ධ කරුණු උගත්තේ ය. හර්විට්ස් සමඟ වැඩ කරන අතරතුර ඔහුගේ පුස්තකාලයේ පැවති උද්භිද විද්‍යාව හා සත්ත්ව විද්‍යාව පිළිබඳ පොත් කියවීමෙන් ෆොබෙල්ගේ මිනුම් කටයුතු, ජ්‍යාමිතිය හා ගණිතය, ස්වභාවධර්මය හා ගණිතය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සංවර්ධනය විය (Weston, 2000: 2). ස්වභාවධර්මය පිළිබඳ ෆ්‍රොබෙල්ගේ පැවති කුතුහලය හේතුවෙන් ඒ පිළිබඳව විද්‍යාත්මකව වැඩිදුර අධ්‍යයනය සඳහා ඔහු ක්‍රි.ව. 1799 දී ජර්මනියේ ජෙනා විශ්වවිද්‍යාලයට ඇතුළත්ව තම සහෝදරයා සමඟ එක්ව ඛනිජ විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය, භාෂාව, ගෘහ නිර්මාණ ශිල්පය සහ භූමි අධ්‍යයනය යන පාඨමාලා හැදෑරීය. කෙසේ වෙතත් අධ්‍යාපනය සඳහා වියදම් කිරීමට මුදල් නොමැතිවීමෙන් ඇතිවූ මූල්‍ය ගැටලු හේතුවෙන් ඔහුට අධ්‍යාපනය අතරමග නවතා දැමීමට සිදු විය (Kahr, 2013: 5). ඉන් පසු ඔහු සුදුසු රැකියාවක් සොයාගැනීමේ අරමුණින් ෆ්‍රැන්ක්ෆර්ට්හි ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව අධ්‍යයනයට යොමු විය (Stephen, 1994:3). ස්වීඩන් පවුලක සාමාජිකයකු වන හොල්ෂාහුසෙන් (Holzhausen) සමඟ පැවති සමීප මිත්‍රත්වය හේතුවෙන් ඔහු ක්‍රි.ව.1806 දී ස්විට්සර්ලන්තයේ යුවේර්ඩන් (Yverdon) වෙත ගොස් ස්වීඩන් අධ්‍යාපනඥ ජෝන් පෙස්ටලොසිගේ

(Johann Pestalozzi) අධ්‍යාපන ක්‍රම අධ්‍යයනය කළේය. අනතුරු ව පෙස්ටලොසිගේ අධ්‍යාපන ක්‍රම ප්‍රායෝගිකව භාවිතකරමින් පාසලක පුහුණුකරුවකු ලෙස සේවය කළේ ය (Stephen, 1994:5). පෙස්ටලොසි යනු නිරීක්ෂණය සහ ක්‍රියාකාරී ඉගෙනුම වඩාත් වැදගත් ඉගෙනුම් ක්‍රියාකාරකම් බව අවධාරණය කළ සුප්‍රසිද්ධ විද්‍යාඥයෙකි (Kahr, 2013: 4). ෆ්‍රොබෙල් පෙස්ටලොසිගේ ඉගැන්වීම් අනුව යමින් ෆ්‍රැන්ක්ෆර්ට් සහ ස්විට්සර්ලන්තයේ යුවෙර්ඩන්ලස්බෙයින් නගරවල පාසල් ගුරුවරයකු ලෙස සේවය කළ අතර එහිදී ඔහු වංශාධිපති පවුලක පුද්ගලික ගුරුවරයකු ලෙස ද සේවය කළේ ය. අනතුරුව ඔහු ක්‍රි.ව. 1808 සිට ක්‍රි.ව. 1810 දක්වා ස්විට්සර්ලන්තයේ යවර්ඩෝර් විශ්වවිද්‍යාලය, ගොටින්ගන් විශ්වවිද්‍යාලය සහ බර්ලින් විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල පෙස්ටලොසි අධ්‍යාපන ක්‍රම පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක නිරතවිය. ෆ්‍රොබෙල් එම විශ්වවිද්‍යාලවලදී නව පාසල් ආරම්භ කිරීම, පාසල් කළමනාකරණය හා අධ්‍යාපන ක්‍රම දියුණු කිරීම පිළිබඳව හැදෑරීය. ඒ ඇසුරින් ලබාගත් දැනුමෙන් රචනා කරන ලද ළමා අධ්‍යාපනය පිළිබඳ ඔහුගේ පළමු කෘතිය ක්‍රි.ව.1826 දී 'ද එඩියුකේෂන් ඔෆ් මෑන්' (The Education of Man) ලෙස ප්‍රකාශයට පත් විය (Hoekins & Smedley, 2016: 3).

ෆ්‍රොබෙල් ක්‍රි.ව. 1837 දී ජර්මනියේ බ්ලැන්කන්බර්ග් (Blankenburg) නගරයේ දී පළමු පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ''කින්ඩර්ගාටන්'' (Kindergarten) නමින් විවෘත කළේය. එහිදී ශාරීරික, බුද්ධිමය, සමාජීය, චිත්තවේගීය සහ අධ්‍යාත්මික වශයෙන් ශිෂ්‍යයාගේ පෞරුෂ සංවර්ධනය සිදුවන අයුරින් ඉගෙනුම් අත්දැකීම් ලබාදීම පිළිබඳව අවධානය යොමු කළේය. ඒ අනුව ක්‍රීඩාවේ වැදගත්කම සහ ඉගෙනුම ස්වාභාවිකව සිදුවීමේ වැදගත්කම ඔහු පැහැදිලි කළේ ය (Hoekins & Smedley, 2016: 4). මෙය මුල් ළමාවිය සංවර්ධනයට හා ප්‍රාථමික අධ්‍යාපනයට ක්‍රීඩාව සහසම්බන්ධ කරගනිමින් සිදුකරන ක්‍රියාකාරකම්වල මූලික අවස්ථාව විය. ෆ්‍රොබෙල් ශිෂ්‍යයාගේ සක්‍රිය චාලක ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ගවේෂණයට, නව සොයාගැනීම්වලට සහ නව නිර්මාණවලට නිදහස ලබාදීම සඳහා වෘත්තිකයන් දරුවන් සමග වැඩ කිරීමේ වැදගත්කම පැහැදිලි කළේය. අසුන්ගත ඉගැන්වීම්වලට වඩා ක්‍රීඩා හා චාලක ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ඉගෙනුම් අත්දැකීම් සම්ප්‍රේෂණය කිරීම නූතන පූර්ව ළමාවිය

සංවර්ධන වැඩසටහන්වල ද මුඛ්‍ය ලක්ෂණයකි. ෆ්‍රොබෙල් ක්‍රි.ව.1852 දී ඔහුට වයස අවුරුදු හැත්තෑවේදී මිය ගියේය.

**ෆ්‍රොබෙල් න්‍යායය**

18 වැනි සියවසේ යුරෝපයේ පැවති බුද්ධිමය විප්ලවය ෆ්‍රොබෙල්ගේ දාර්ශනික ප්‍රවේශය සකස්වීමට හේතුවූ අතර පූර්ව ළමාවිය මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය ඔහුගේ සමකාලීනයන්ගේ සංකල්පවලට වඩා නවමු මුහුණුවරකින් යුක්ත විය. ඒ අනුව ළදරු පාසලේ (Nursery School) නව මුහුණුවර වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ (Kindergarten) නිර්මාතෘවරයා බවට පත්වෙමින් සමස්ත ලෝකයෙහිම ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ සුවිශේෂ ස්ථානයක් ෆ්‍රෙඩ්රික් ෆ්‍රොබෙල් හිමිකර ගත්තේ ය (Asha, 2015: 6). ඔහු පූර්ව ළමාවිය පිළිබඳ ප්‍රමුඛ න්‍යායාචාර්යවරයෙක් මෙන්ම නූතන පූර්ව ළමාවිය අධ්‍යාපනය සංවර්ධනයට දැඩි බලපෑමක් කළ චින්තකයෙක් ද විය (Brehony, 2013: 59). එහෙයින් ෆ්‍රොබෙල්ගේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ජාත්‍යන්තර අධ්‍යාපන ක්‍රමයක් ලෙස සංවර්ධනය වූ අතර ෆ්‍රොබෙල් න්‍යායයේ අධ්‍යාපන මූලධර්ම බොහෝ රටවල පූර්ව ළමාවිය අධ්‍යාපනයේදී දීර්ඝ කාලයක් භාවිතයට ගෙන ඇත. නූතන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ෆ්‍රොබෙල්ගේ පූර්ව ළමාවිය පිළිබඳ න්‍යායය, ක්‍රියාකාරකම් සහ අදහස් අත්‍යවශ්‍ය මූලධර්ම බව පැහැදිලිය (Provenzo, 2009: 85). එම මූලධර්මවලට පූර්ව ළමාවිය අධ්‍යාපනයේ භාවිත වන අංක සහ වචන ක්‍රීඩා, ගීත, චිත්‍ර ඇඳීමේ ක්‍රම සහ පාරිසරික ක්‍රියාකාරකම් ඇතුළත් ය (Tovey, 2013: 1). පූර්ව ළමාවිය අධ්‍යාපනයේ වැදගත්කම අද්‍යතනයෙහි විශ්වීය වශයෙන් පිළිගත්ත ද පූර්ව ළමාවිය අධ්‍යාපනයේ සැබෑ ආරම්භක ස්ථානය වන ෆ්‍රොබෙල්ගේ ප්‍රවේශය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයන දියත් වී නොමැත (Tovey, 2013: 1). එහෙත් ෆ්‍රොබෙල්ගේ න්‍යායය පිළිබඳ අනවබෝධයකින් වුවද ඔහුගේ දර්ශනය සහ ඉගෙනුම් උපකරණ පූර්ව ළමාවිය අධ්‍යාපනයේ ජනප්‍රියත්වයට පත් ව ඇත.

ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන න්‍යාය සංවර්ධනය උදෙසා පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනයේ ආභාෂය ලැබුණි (Baidya, et al, 2015:135). ඒ අනුව පෙස්ටලොසි හා සමානව සකස් කරන

ලද ප්‍රායෝගික ද්‍රව්‍ය හැසිරවීම ආදී සංයුක්ත ක්‍රියාකාරකම් මගින් ශිෂ්‍යයා ලෝකය සමඟ අන්තර්ක්‍රියා කිරීමට අවස්ථාව උදාකර ගන්නා බවත් එමගින් ශිෂ්‍යයා තමා වටා පවතින ලෝකය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගන්නා බවත් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික සංවර්ධනයට ළමා ක්‍රීඩා ප්‍රධාන හේතුවක් වන බවත් ඔහුගේ අදහස විය. විඥානවාදී දර්ශනයේ මෙන් සෑම දරුවෙකුගේම සංවර්ධනයට උපකාර වන සහජ අභ්‍යන්තර බලයක් පවතින බව ඔහු දැක්වී ය (Best, 2016: 4). දුම්මල ස්වභාවිකවම ගස තුළ කුඩා කාලයේ පටන් පවතින්නාක් මෙන් සෑම ජීවියකුගේම අනාගත ජීවිතය සංවර්ධනය සහ ගොඩනැගීම සඳහා අවශ්‍ය ශක්තිය ජීවිතය ආරම්භයේදී ජීවියා සමඟ පවතින බව ඔහුගේ අදහස විය (Asha, 2015: 7). ජීවිතයේ පළමු වසර තුන මොළයේ වර්ධනයට සැලකිය යුතු බලපෑමක් සිදුකරන බව අනාවරණය කළ සමකාලීන අධ්‍යයනයන්හි අනාවරණ, එම අධ්‍යයනවලට පූර්වයෙන්, ෆ්‍රොබෙල් විවිධ ප්‍රවේශවලින් පැහැදිලි කර ඇත (Bruce, 2012: 18). ඒ අනුව මානව මොළයේ සංවර්ධනය පළමු වසර තුනෙහි තරමක් වේගවත්ව සිදුවන බව ප්‍රකාශ කළ ෆ්‍රොබෙල් දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය උපරිම කිරීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපනයේ වැදගත්කම අවධාරණය කළේ ය (Boes, 2014:295). නූතන පූර්ව ළමාවිය අධ්‍යාපනයේ සුවිශේෂ අරමුණක් වන සමාජානුයෝජනය, අත්‍යවශ්‍ය අධ්‍යාපන මූලධර්මයක් ලෙස ෆ්‍රොබෙල් විසින් පූර්ව ළමාවිය අධ්‍යාපනයේ දක්වා ඇත (Kibor, 2004: 193). නූතන පූර්ව ළමාවිය අධ්‍යාපනඥයෝ ද සමාජානුයෝජනය සහ ඉගෙනුමට දරුවා සූදානම් කිරීම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙන් සිදුවිය යුතු බව අවධාරණය කරති (Asha, 2015: 8). ෆ්‍රොබෙල්ට අනුව පූර්ව ළමාවිය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය මත පුද්ගලයාගේ, පවුලේ සහ ජාතීන්ගේ සෞඛ්‍යය සහ සතුට රඳාපවතියි (Weston, 2000: 15). ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපනය දර්ශනයේදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක වැදගත්කම අවධාරණය කළ අතර ක්‍රීඩාව පදනම් කරගත් ඉගෙනුම්-ඉගැන්වීම් ආකෘතියක් ඉදිරිපත් කළ පළමු අධ්‍යාපනඥයා වෙයි (Weston, 2000: 21). ඔහු සාම්ප්‍රදායික අධ්‍යාපනයේ වනපොත්කරණයට හා යාන්ත්‍රික ස්මරණවලට ප්‍රතිවිරුද්ධ ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලින් සිදුකරන ඉගෙනුමක් පිළිබඳ අදහස් දැක්වීය. එය ශිෂ්‍යයාට නිදහස් චින්තනයක් සහිත පුද්ගලයකු

ලෙස සංවර්ධනයට අවශ්‍ය මග පෙන්වයි (Baidya, et al, 2015:136) (Tovey, 2013: 2). ෆ්‍රොබෙල්ගේ මෙම අදහස් නූතන පූර්ව ළමාවිය අධ්‍යාපන න්‍යාය සහ ප්‍රවේශ සංවර්ධනයට අවශ්‍ය පසුබිම නිර්මාණය කළ බව පැහැදිලිය.

**ෆ්‍රොබෙල් න්‍යායයේ මූලධර්ම**

**ක්‍රීඩාවෙන් ඉගෙනුම**

ෆ්‍රොබෙල් ළදරුවා ස්වකීය චාලක ක්‍රියාකාරකම්වලින් නිදහසේ ක්‍රීඩා කරමින්, ක්‍රියාශීලීව හා ප්‍රායෝගිකව යම් යම් සංසිද්ධීන් ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කරමින් සිදු කරන ඉගෙනුමක් පිළිබඳව අදහස් ඉදිරිපත් කළේය. ඒ අනුව ඔහු ඒ ඒ ශිෂ්‍යයාගේ ලැදියාවක් පවතින ක්ෂේත්‍රයේ ක්‍රීඩාක්‍රියාකාරකම් ආශ්‍රයෙන් විෂය කරුණු අනාවරණය කරගනිමින් ඉගෙනීමට යොමු කළේ ය. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පවතින 'සෙල්ලම් පිට්ටනිය' ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන දර්ශනයේ සුවිශේෂ අංගයකි. මේ අනුව ක්‍රීඩාව පූර්ව ළමාවිය විෂයමාලාවට අන්තර්ගත විය යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගතයක් බව ෆ්‍රොබෙල් දක්වා ඇත (Brehony, 2013: 59). ක්‍රීඩාවෙන් සියලු ඉගෙනුම් අත්දැකීම් සමෝධානය වන බැවින් දරුවාගේ සක්‍රීය සංවර්ධනයට ක්‍රීඩාව මග පාදන බව ඔහුගේ අදහසයි (Tovey, 2013: 3). මේ අනුව ක්‍රීඩා පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවන චාලක ක්‍රියාකාරකම් අර්ථශූන්‍ය ක්‍රියාකාරකම් සමූහයක් නොවන අතර සතුට ජනනය කරමින් සිසු ක්‍රියාකාරිත්වය වර්ධනය කරන ගවේෂණයට සහ අවබෝධයට මග පෙන්වන ජීව විද්‍යාත්මක අවශ්‍යතාවකි (Meta, 2015: 25). එමගින් ක්‍රීඩාව යනු ළමා ක්‍රියාකාරකම් හා ළමාගති ලක්ෂණවල කොටසක් බවත් ළමා හැඟීම් සහ සිතුවිලි සංවර්ධනයට, ඔහුගේ ධෛර්යය, සහජ බුද්ධිය සහ අභිප්‍රේරණය ඉහළ නැංවීමට ක්‍රීඩාව අත්‍යවශ්‍ය අධ්‍යාපනික මෙවලමක් බවත් පැහැදිලිය (Asha, 2015: 7). ශිෂ්‍යයා ක්‍රීඩා කිරීමෙන් ඔහුගේ ස්වයං දැනුවත්භාවය විවිධාකාරයෙන් සංවර්ධනය කරගනියි. සාමකාමීව ක්‍රීඩාවක යෙදෙන ශිෂ්‍යයා සාර්ථක, සන්සුන්, ශක්තිමත් වැඩිහිටියෙකු මෙන් ම තමාගේ සහ අන්‍යයන්ගේ යහපැවැත්මට සහය වන්නෙකු බව ෆ්‍රොබෙල්ගේ අදහසයි (Allen, 1982: 319).

මේ අනුව ඉගෙනුම් ක්‍රීඩා මෙවලම් සහ ක්‍රීඩාව මත පදනම් වූ අධ්‍යාපන සංකල්පයෙහි නිර්මාතෘවරයා ලෙස ෆ්‍රොබෙල් දැක්විය හැකි ය.

ෆ්‍රොබෙල්, ශිෂ්‍යයාගේ ඇඟිලිවල ක්‍රියාකාරීත්වය සංවර්ධනය උදෙසා වැලි, සිප්පි කටු, ගල් කුරු, මැටි සහ කඩදාසි ආදී ද්‍රව්‍ය යොදා ගනිමින් සිදුකරන වැලි පිරවීම, සිප්පිකටු ඇලවීම, කඩදාසි නැමීම ආදී ක්‍රියාකාරකම්වලින් ඉගෙනුම් අත්දැකීම් සම්ප්‍රේෂණය සඳහා විවිධ චාලක ක්‍රියාකාරකම් යොදාගත්තේ ය. මෙම ද්‍රව්‍ය දරුවන්ට සංකල්ප ගවේෂණයට, නිර්මාණශීලීත්වයට සහ යම් යම් වස්තූන්වල ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනයට යෝග්‍ය පරිදි ක්‍රීඩාවලට සම්බන්ධ කරමින් සැලසුම් කර ඇත. දරුවන්ට තෝරා ගැනීමට විවිධ ද්‍රව්‍ය ලබාදීමෙන් විවිධ සංකල්ප ගවේෂණය කිරීමට සහ ඔවුන්ගේ ම ඉගෙනුම් අවධිය සඳහා සුදුසු ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ද අවස්ථාව උදා වෙයි.

ළමයාගේ සංවර්ධන වේගයට අනුව ළමයි එකිනෙකාට විවිධත්වයෙන් යුක්තව විවිධාකාරවලින් උගනිති. ළමයාගේ සංවර්ධන වේගය අනුව ඉගෙනීමට අවස්ථාව ලබාදීමෙන් ළමයා වඩාත් ඵලදායී ලෙස සංවර්ධනය වෙයි. ඒ අනුව ඒ ඒ අවධිවල ශිෂ්‍යයගේ සංවර්ධන වේගය හඳුනාගනිමින් එයට යෝග්‍ය සැලසුම් කරන ලද ඉගෙනුම් අත්දැකීම් සමුදායක් කුසලතා සහ හසුරුකුසලතා ලෙස ෆ්‍රොබෙල් දක්වයි.

**කුසලතා සහ හසුරු කුසලතා**

ෆ්‍රොබෙල් හඳුන්වා දුන් සුවිශේෂ අධ්‍යාපන සංකල්ප දෙකක් ලෙස කුසලතා සහ හසුරු කුසලතා ලෙස හැඳින්වූ අධ්‍යාපන මෙවලම් සහ ක්‍රියාකාරකම් දැක්විය හැකිය. ඔහු ''කුසලතා'' ලෙස හැඳින්වූ ද්‍රව්‍යවලට ලීවලින් තැනූ කැට, විශේෂයෙන් නිර්මාණය කරන ලද බෝල, කුට්ටි සහ කුරු අන්තර්ගතවූ අතර 'හසුරු කුසලතාවලට' (Occupation) රෙදි විවීම, පින්තාරු කිරීම, මැටි, වැලි, මඩවලින් කාටූන් සහ ආකෘති නිර්මාණය, කඩදාසි නැවීම, කැපීම සහ ඇලවීම ආදී ක්‍රියාකාරකම් ඇතුළත් විය (McCann, 2013: 239). මෙම ද්‍රව්‍ය සරල වුවත්, ඒවා විවිධාකාරයෙන් දරුවාගේ ඉගෙනුම ශක්තිමත් කරන අතර, ද්‍රව්‍ය හැසිරවීමෙන් වියුක්ත සංකල්ප ඉගෙනීමට මෙන්ම දරුවාගේ කායික හා මානසික පරිනත භාවය සඳහා සහායවීමට

හැකි ය (Provenzo, 2009: 97). මෙම ක්‍රියාකාරකම්වලින් දරුවන්ගේ බුද්ධිමය සංවර්ධනය සඳහා අල්ලා ගැනීම, මුදා හැරීම, සෙලවීම, පෙරළීම, වස්තූන් සැඟවීම වැනි චාලක ක්‍රියාකාරකම් මෙන්ම වියුක්ත සංකල්ප වන මෙහි, එහි, යට, උඩ, වම, දකුණ, විශාල, කුඩා ඉගෙනීමට ද දරුවන්ට උපකාර වෙයි (Provenzo, 2009: 97). මෙසේ වැඩිහිටි වෘත්තීය ජීවිතය සඳහා දරුවා තමන්ව සූදානම් කරගැනීමක් මෙමගින් සිදුවෙයි (Asha, 2015: 8). ෆ්‍රොබෙල්ගේ දර්ශනය ස්වභාවධර්මය හා සම්බන්ධව සංවර්ධනය විය. ඒ අනුව ස්වභාවික පරිසරයේ සිටින සත්වයන්, එළවළු සහ පාෂාණ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම් උපකරණ විය (Provenzo, 2009: 87).

ෆ්‍රොබෙල් හඳුන්වා දුන් "කුසලතා සහ හසුරු කුසලතා" අද්‍යතනයෙහි නව මුහුණුවරකින් පූර්ව ළමාවිය අධ්‍යාපනයේ දී භාවිත වෙයි. උපතේ සිට අවුරුදු පහ දක්වා කාලයෙහි විවිධ ළමා සංවර්ධන අවධිවල සිටින ළදරුවන්ගේ ඉගෙනුම් සංවර්ධනයට ෆ්‍රොබෙල් කුසලතා සහ හසුරු කුසලතා ලෙස හැඳින්වෙන අවධි හයකදී සංවර්ධනය විය යුතු කුසලතා හා ක්‍රියාකාරකම් හඳුන්වා දුණි. ඒ අනුව ෆ්‍රොබෙල් දරුවන්ට ගවේෂණය කිරීම සඳහා විවිධ හැඩවලින් යුත් ලී කුට්ටි කට්ටලයක් (බ්ලොක්) නිර්මාණය කළේ ය. ලී කුට්ටි කට්ටලය කලින් නියම කරගත් ආකෘතික ස්වරූපයෙන් දරුවන්ට ලබා දුණි. මෙකී බ්ලොක් ක්‍රීඩාව දශක ගනනාවක සිට මුල් ළමාවිය සංවර්ධනයේදී ජනප්‍රිය ළමා ක්‍රියාකාරකමක් බවට පත්ව ඇත. ෆ්‍රොබෙල්ගේ කුසලතාවලට බ්ලොක් ක්‍රීඩාව ඍජුව සම්බන්ධ වෙයි. බ්ලොක් ක්‍රීඩාවේදී ලී කුට්ටි කට්ටල නොයෙක් හැඩතලවලින් යුක්ත ව නැවත නැවත සකස් කිරීමේ ක්‍රියාකාරකම්වලින් ශිෂ්‍යයා ඝන ද්‍රව්‍ය වර්ගීකරණය, හැඩතල හැසිරවීම සහ අවකාශීමය සංවේදන සංවර්ධනය කර ගනියි (Reinhold, et al, 2013: 3). කුසලතාවෙහි ආකාර අංක එකේ සිට හය දක්වා වර්ග කර ඇත. ඒ අනුව

කුසලතා 1 (උපතේ සිට අවුරුදු 1)

කුසලතා අතර පළමු කුසලතාව ළදරු කුසලතාව යි. එහිදී දරුවාගේ අතේ ප්‍රමාණයට සකසන ලද කුඩා මෘදු බෝලයක් හෝ දෘඩ

ස්වභාවයෙන් යුත් කඹ නූල් මෙන් දැඩිව සකසන ලද කුඩා බෝලයක් ඉගෙනුම් උපකරණය ලෙස යොදාගනියි. බෝලය අල්ලාගෙන සිටීමෙන්, බිම දැමීමෙන්, මිරිකීමෙන් සහ පෙරළීමෙන් හෝ තම මව, පියා, අන්‍යයන් විසින් එය හසුරුවනු දැකීමෙන් දරුවා අවකාශමය සම්බන්ධතා, චලනය, වේගය, වර්ණ අතර ඇති වෙනස, බර සහ එහි හැසිරීම අවබෝධ කරගැනීමට උත්සාහ කරයි.

කුසලතා 2 (අවුරුදු 1-2)

''දරුවාගේ සතුට'' යනුවෙන් හැඳින්වෙන දෙවන කුසලතාව සඳහා ඉගෙනුම් උපකරණය ලෙස ලී ගෝලයක් සහ ලී කැටයක් යොදාගනියි. ෆ්‍රොබෙල් මෙම කුසලතාවට දාරුමය වස්තූන් දෙක අතර ඇති වෙනස්කම් හඳුනාගත් සෑම දරුවෙකුගේම සතුට නිරීක්ෂණය කිරීමෙන් පසු ''දරුවාගේ සතුට'' ලෙස එය නම් කළේ ය. පසුකාලීන සංස්කරණවලදී දැවමය සිලින්ඩරයක් ද එයට එක් විය.

මෙම හැඩතල ඇසුරින් දරුවාට ඒවායෙහි පවතින විවිධ ලක්ෂණ නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දුණි. ඕනෑම දිශාවකින් බලනවිට ගෝලය එකම ආකාරයෙන් දෘශ්‍යමාන වන අතර ඝනකය විවිධාකාරයෙන් දෘශ්‍යමාන වෙයි. ඝන පෘෂ්ඨයක් මත පෙරළෙන විට ගෝලයෙන් යම් ශබ්දයක් නැගෙන අතර, ඝනකයකින් එබඳු ශබ්ධයක් හට නොගනී. එය තැබූ ස්ථානයේම ඒ ආකාරයෙන්ම පවතියි. පෙරළීම අපහසුය.

කුසලතා 3 (අවුරුදු 2-3)

මූලිකවම ක්‍රමයෙන් සංවර්ධනය වන කුසලතාවක් ලෙස කුසලතා අංක තුන දැක්විය හැකි ය. එහිදී එක සමාන ලී කැට අටකින් සමන්විත ඉදිකිරීමක් ඉගෙනුම් උපකරණය වෙයි. එම සමාන ලී කැට අට ගලවා නැවත සකස් කිරීමට ලබාදෙයි. එම නිර්මාණය එකිනෙකට වෙනස් ආකාරවලින් ගොඩනැගීමට හැකිවන ලෙස සකස් කර ඇත. මෙමගින් නිර්මාණකරණය පිළිබඳ මූලික සංකල්ප ජනනය කරයි.

කුසලතා 4 (අවුරුදු 3-4)

සිවුවන කුසලතාවේ ඉගෙනුම් උපකරණය තෙවන කුසලතාවේ උපකරණය හා සමාන ය. එහිදී කුඩා කැබලිවලින් සැදූ ඝනකයක් වෙන්කර නැවත සකස් කිරීමට ලබාදෙයි. මෙම ආකෘතිය සෘජුකෝණාස්‍රාකාර ලී කැබලිවලින් සාදා ඇති අතර, කලින් කුසලතාවෙහි කැටවල පළල මෙන් දෙගුණයක් දිග සහ අඩක් පළලින් යුක්ත ය. මෙය ක්‍රමයෙන් සංවර්ධනය වන නව හැකියා සඳහා අවකාශය විවර කරයි.

කුසලතා 5 (වසර 4-5)

මෙම කුසලතාව සඳහා වන ඉගෙනුම් උපකරණය සිවු වන කුසලතාවට වඩා තවත් කැටවලින් යුක්තව අඩකට හෝ හතරකට බෙදා ඇත. ෆ්‍රොබෙල් මෙම කුසලතාවෙන් ගණිත සංකල්ප ක්‍රමානුකූලව ගොඩනැගීම අපේක්ෂා කරන අතර දරුවාට වඩාත් සංකීර්ණ ව්‍යූහයන් ගොඩ නැගීමට අවස්ථාව ලබාදුණි.

කුසලතා 6 (අවුරුදු 5-6)

මෙම කුසලතාවට අයත් ලී මෙවලම් කට්ටලය වඩාත් සංකීර්ණ ලී කැබලිවලින් යුක්තව සකස්කර ඇත. එහිදී විවිධාකාර නිර්මාණ සිදුකළ හැකි අයුරින් සකසා ඇත.

**චලනයේ වැදගත්කමඃ සංගීතය සහ රිද්මය**

ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන දර්ශනයෙහි ළමා සංවර්ධනය සඳහා ශාරීරික චලනය අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්‍රියාකාරකමක් ලෙස දක්වා ඇත. ඒ අනුව වාදනය කිරීම, ගීත ගායනය, නර්තනය සහ ඉන්ද්‍රියන්ගේ චලනය ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන න්‍යායයේ ප්‍රධාන ඉගෙනුම් ක්‍රියාකාරකම් විය. නැළවිලි ගීත, ළමා ගීත සහ මව හා ළදරුවා එක්ව සිදුකරන ක්‍රීඩා යනු ළදරුවාට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස ෆ්‍රොබෙල් දක්වයි (Powell & Goouch, 2015: 2). මවගේ සහ දරුවාගේ දෛනික ක්‍රියාකාරකම් නිරීක්ෂණයෙන් පසු ෆ්‍රොබෙල් මව්වරුන්ට තම දරුවන් සඳහා නිවසේදී භාවිත කළ හැකි

ගීත සහ රිද්ම මාලාවක් ද නිර්මාණය කළේ ය (Tovey, 2013: 12). ෆ්‍රොබෙල්ගේ "මාතෘ වාදන සහ පෙර පාසැල් ගීත" (Mother-Play and Nursery Songs) කෘතියෙහි දරුවන්ගේ ශාරීරික, මානසික, සමාජීය සහ සදාචාරාත්මක සංවර්ධනය උදෙසා නිර්මාණය කරන ලද ඇඟිලිවලින් කරන ක්‍රීඩා සහ ළමා ගීත අන්තර්ගත විය (Asha, 2015:7). මෙම කෘතියෙහි ක්‍රියාකාරකම් විස්තර කිරීමට නිදර්ශන ද ඇතුළත් ය. ගීත සහ ක්‍රීඩා මූලිකව නිවසේ භාවිතය සඳහා නිර්මාණය කළ ද පසුකාලීනව පාසල්වල ද භාවිතයට ගැනුණි. ෆ්‍රොබෙල්ගේ සංගීතය සහ රිද්ම අභ්‍යාස නූතන ළමා ගීත සහ ඇඟිලිවලින් කරන ක්‍රීඩාවල පදනම වන අතර (Tovey, 2013: 12) එය පූර්ව ළමාවිය අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය ඉගෙනුම් මෙවලමක් බවට පත්ව ඇත.

නිදහස් ක්‍රීඩාව ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන න්‍යායයේ හදවත වුව ද ඉගෙනුම් පරිසරය සෑම දරුවෙකුගේම සංවර්ධන මට්ටමට යෝග්‍ය ලෙස ප්‍රවේශමෙන් නිර්මාණය කළයුතු බව ඔහු දැක්වීය. ෆ්‍රොබෙල් එළිමහන් ඉගෙනුමේදී ස්වාභාවික ඇවිදීම සහ ගෙවතු වගාව සඳහා අවස්ථාව ලබා දුණි. ශිෂ්‍යයාට ඵලදායි ලෙස ඉගෙනීමට අවකාශය හා ආලෝකය අවශ්‍ය බව ඔහු අවධාරණය කළ අතර දරුවා විසින් ලෝකය පිළිබඳ ඔහුගේ අවබෝධය සංවර්ධනය කරගනු ලබන්නේ ඒ සමඟ පවත්නා ඍජු අත්දැකීම්වලින් බව ෆ්‍රොබෙල්ගේ අදහස විය. එළිමහන් ඉගෙනුම ද ළමා සංවර්ධනය සඳහා වැදගත් මූලධර්මයක් වන ශාරීරික චලනය පිළිබඳ මූලධර්මය සමඟ සම්බන්ධ වන්නකි. ඒ අනුව ළමා සංවර්ධනයට සහය වෙමින් විවිධ සංකල්ප පිළිබඳ ළමයාට ගැඹුරු අවබෝධයක් ලබාදීම සඳහා ක්‍රියාකාරකම් පාදක විෂයමාලාවක් නූතන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ද ක්‍රියාත්මක වෙයි.

### පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය - Kindergarten

ෆ්‍රොබෙල් ක්‍රි.ව. 1837 ජර්මනියේ බ්ලැන්කන්බර්ග්හි දී පළමු පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය 'කින්ඩර්ගාටන්' (Kindergarten) නමින් විවෘත කළේ ය. එමගින් ඔහු ළදරු පාසල් අධ්‍යාපනයේ පියා යන විරුදාවලිය ලැබීය (McCann, 2013: 237). පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය (Kindergarten) යනු ළමයින්ගේ නිදහස් ක්‍රියාකාරකම්

සඳහා සකසන ලද උද්‍යානයක් හෝ ළමයින්ට ඉගෙනීමට වෙන්කර ඇති වත්තකි (Baidya, et al,2015;132).

ෆ්‍රොබෙල්ගේ පූර්ව ළමාවිය අධ්‍යාපන දර්ශනයේ අධ්‍යාපනයෙන් අපේක්ෂිත අරමුණු කිහිපයක් විය. ඒ අනුව ගතින් හා සිතින් නිදහස්ව ක්‍රියා කරන මිනිසුන් බිහිකිරීම එහි මුඛ්‍ය අරමුණ විය (Stephen, 1994:12). මේ අනුව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනු ළදරුවාගේ පසුකාලීන අධ්‍යාපනයේ සාර්ථකත්වය තීරණය කරන ප්‍රධාන සාධකයක් බව පැහැදිලිය (Meta, 2015: 25). පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ළදරු ශිෂ්‍යයාගේ කායික, වාචසික, මානසික හා සාමාජීය සංවර්ධනය පිළිබඳ අවධානයෙන් එම ක්ෂේත්‍රවල ශිෂ්‍ය හැකියා උපරිම කිරීම සඳහා ඉගෙනුම් අත්දැකීම් සැලසුම්කර ඉදිරිපත් කරයි. ඔහුගේ පළමු පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ වයස අවුරුදු දෙකත් හතත් අතර ළමයින් පනස් දෙනෙකු ලියාපදිංචි විය. එහිදී උදේ හය සහ සවස හත අතර සේවා මුර වැඩ කරන දෙමාපියන්ට නම්‍යශීලී සහන සලසා දෙමින් ද දුප්පත් දරුවන්ට ආහාර සහ ඇඳුම් ආධාර ලබා දෙමින් ද ළදරු පාසලේ සියලු සේවා නොමිලේ ලබාදෙමින් ද ක්‍රියාත්මක විය (Weston, 2000: 17). ෆ්‍රොබෙල්ට අනුව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනු අනාගත පරම්පරාවේ නිවහන යි. එහි ගුරුවරු - ගෙවතු හිමියන් වන අතර සිසුහු - ගුරුවරුන් විසින් වගා කරන ලද පැල බවට පත් වෙති (Asha, 2015: 6). ෆ්‍රොබෙල්ගේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (Kindergarten) රූපකයකි. ඒ අනුව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (Kindergarten) යනු දරුවා මල් පිපී මලක් මෙන් වැඩෙන උද්‍යානයකි (Noddings, 2018: 20).

**එළිමහන් ක්‍රියාකාරකම්**

අධ්‍යාපනය පිළිබඳ ෆ්‍රොබෙල් න්‍යායයේ සුවිශේෂ සංකල්පයක් ලෙස එළිමහන් ක්‍රියාකාරකම් දැක්විය හැකි ය. ඔහුට අනුව 'ළමයින්ගේ පාසැලක්' යනු දරුවන්ට සෙල්ලම් කිරීමට, ඉගෙනීමට සහ ඔවුන්ගේ විවිධ කුසලතා සංවර්ධනයට අවශ්‍ය උද්‍යාන අවකාශයක් පවතින ස්ථානයකි. ඒ අනුව සෑම දරුවෙකුට ම යමක් වගාකළ හැකි කුඩා බිම් කොටසක් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (Kindergarten)

ගෙවත්තේ පැවතිය යුතු ය. මෙසේ ෆ්‍රොබෙල් දරුවන්ට ගෙවතුවගාව සහ ස්වාභාවික පර්යේෂණ පිළිබඳ පුහුණුව ලබාදීමේ වැදගත්කම අවධාරණය කළේ ය (Baidya, et al, 2015:136). ළමයින්ට සුළඟ දැනෙන විට, ක්‍රැන්බෙරි රස ඇනෙන විට, ලෝකය අත්විඳින විට සහ ගෙවතුවගා කටයුතුවලදී තම සිරුර චලනය කිරීමට විවිධ අවස්ථා සොයාගන්නා විට ඔවුන් ශරීරයේ සියලු ඉන්ද්‍රිය භාවිත කරමින් උගනියි (Tovey, 2013: 111). පැළයක් රැක බලා ගැනීමෙන්, එය වැඩෙන ආකාරය නිරීක්ෂණයෙන්, වෙහෙස මහන්සි වී වැඩකිරීම දැකීමෙන් ශිෂ්‍යයා ස්වාභාවික පරිසරයේ සංසිද්ධීන් ඉගෙනුම් අත්දැකීම් ලෙස අන්තර්ග්‍රහණය කරගනියි. එහිදී යම් අවස්ථාවක් හෝ සංසිද්ධියක් පිළිබඳ සාර්ථකවීමේ වගකීම භාරගන්නේ කෙසේ ද නැතහොත් යමක් අසාර්ථකවීමේ වගකීම භාරගන්නේ කෙසේ ද යන්න උගනියි. උද්‍යානයේදී දරුවා ස්වභාව ධර්මය නිරීක්ෂණයෙන් කාලගුණයේ වෙනස්වීම්, නව සත්ව සහ ශාක පිළිබඳව ගවේෂණාත්මකව අධ්‍යයනය කරයි. එහිදී ජීවිතය සහ මරණය වැනි ගැඹුරු වියුක්ත සංකල්ප පවා ඔහු උගනියි.

ෆ්‍රොබෙල්ගේ න්‍යායයේ එළිමහන් ක්‍රියාකාරකම් මූලධර්මයේදී ඔහු දරුවන් කුතුහලයෙන් පිරි, නිර්මාණශීලී සහ ක්‍රියාශීලී ජීවීන් පිරිසක් ලෙස හඳුනා ගත්තේ ය. එම ජීවීන් ඔවුනොවුන්ට සහ ස්වභාවධර්මයට සමීප සිත් ඇදගන්නා සහ උත්තේජක පරිසරයක ජීවත් වන විට වඩාත් හොඳින් සංවර්ධනය වන බව ඔහු නිරීක්ෂණය කළේ ය. ඔහුට අනුව කුඩා දරුවා ගෙවතු වගාව හා සහසම්බන්ධ වූ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වලින් ගැටලු විසඳීමට පුරුදු වෙයි. එමෙන්ම එළිමහන් ක්‍රියාකාරකම්වල දී සහ නව සොයාගැනීම් කිරීමේදී ශිෂ්‍යයා ඔහුගේ පංචේන්ද්‍රිය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබයි. ඔවුහු නව වර්ණ, සුවඳ, හැඩතල, ද්‍රව්‍ය සහ ශක්තීන් එහිදී අත්විඳිති. දරුවාගේ නිර්මාණාත්මක අංශය ස්පර්ශ කරමින් ඔවුන්ගේ දැනුම් පිපාසය සංසිඳුවීමට අවම විභවයන් සහිත ආරක්ෂිත, ගෘහස්ථ පරිසරයක් අවශ්‍යය ය. එසේ හෙයින් මෙම සියලු අංශ සපුරා ගත හැකි ප්‍රායෝගික අවස්ථා ලබා දෙන එළිමහන් ක්‍රියාකාරකම් ඉගෙනුමට යෝග්‍ය බව ෆ්‍රොබෙල්ගේ අදහස විය.

## අධ්‍යාපනයේ දෙමාපිය සහ ගුරු භූමිකාව

ෆ්‍රොබෙල් පවුලක් ලෙස ජීවත්වීමට සහයවීමේ සහ මනුෂ්‍යත්වය පිළිබඳ ඉගැන්වීමේ වැදගත්කම අවධාරණය කළේ ය. එමෙන්ම දරුවන්ගේ ජීවිතය සහ අධ්‍යාපනය සඳහා දෙමාපියන් ක්‍රියාකාරී භූමිකාවක් ඉටුකළ යුතු බව ද දැක්වී ය (Asha, 2015: 7). ඔහුට අනුව, දරුවන් ගෞරවයෙන් හා උනන්දුවෙන් ඇති දැඩි කළ යුතු අතර වැඩිහිටියන් ඔවුන්ගේ ඉගෙනුමට සහායවීමට මැදිහත් විය යුත්තේ කොතැන ද සහ කවදා ද යන්න දැන සිටිය යුතු ය (Hoskins & Smedley, 2016: 4). ගුරුවරුන් සහ දෙමාපියන් අතර සබඳතා වැඩිහිටියන් හා ළමයින් අතර ඇති සම්බන්ධතාව තරම් ම වැදගත් බව අවධාරණය කළ ෆ්‍රොබෙල් පූර්ව ළමාවිය අධ්‍යාපනයේ ගුරු භූමිකාවේ ක්‍රියාකාරකම් අතරට ක්‍රීඩා කිරීම, නිරීක්ෂණය, සිසු ඉගෙනුම් ක්‍රියාවලියට සහායවීම සහ සිසු ඉගෙනුම් දීර්ඝ කිරීම, සිසුන්ගේ කුතුහලය සහ ප්‍රශ්න දිරිගැන්වීම, ඔවුන්ගේ සිතුවිලි පුළුල් කිරීම, ස්වයං ශික්ෂණය වර්ධනය කරගැනීමට ඔවුන්ට උපකාර කිරීම, ඔවුන්ගේම ගැටලු විසඳීමට සහායවීම සහ දෙමාපියන් සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරකම් ද ඇතුළත් කළේ ය. ඒ අනුව ෆ්‍රොබෙල් යනු පොදු ජනතාව සහ දෙමාපියන් සමඟ එක් ව සහයෝගිතාවකින් පාසල් පැවැත්වීම පිළිබඳ අදහසට පදනම දැමූ චින්තකයෙක් ලෙස ද දැක්විය හැකි ය (Tovey, 2013: 112).

ගුරුවරයා දැනුමේ ආරක්ෂකයා ලෙස නොව ශිෂ්‍යයා ගැඹුරු අවබෝධය කරා මෙහෙයවීමට උපකාර කරන මාර්ගෝපදේශකවරයා ලෙස කටයුතු කිරීම වඩා යෝග්‍ය බව ෆ්‍රොබෙල්ගේ අදහසයි. මේ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී මාර්ගෝපදේශන ලබාදෙමින් සිදු කරන පහසුකම් සැලසීමේ ගුරු භූමිකාවෙන් ශිෂ්‍යයාගේ ස්වයං අභිප්‍රේරණය ඉහළ නැංවීම සිදුවෙයි. එහිදී ශිෂ්‍යයාට වැරදි කිරීමට ඉඩ දිය යුතු බවත්, එම වැරදි හා අත්හදා බැලීම් ඔස්සේ ශිෂ්‍යයා නව දැනුමක් උපාර්ජනය කර ගනිමින් ඉගෙන ගන්නා බවත් ෆ්‍රොබෙල්ගේ අදහස විය.

## සමාලෝචනය

ෆ්‍රොබෙල් ශිෂ්‍යයාගේ කායික, සාමාජීය හා චිත්තවේගීය සංවර්ධනය සිදුවන පූර්ව ළමාවිය අධ්‍යාපනයේ හා පූර්ව ළමාවිය

සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීමේ පුරෝගාමියා විය. ඔහු ළදරුවාගේ ස්වභාවික සංවර්ධනය ළදරුවාගේ උත්පත්තිය සමඟ ම සිදුවන්නක් බව දක්වමින් ශිෂ්‍යයාට ස්වාභාවිකව සංවර්ධනයවීමට අවස්ථාව ලබා දිය යුතු බව දැක්වී ය. ඒ අනුව කුසලතා හා හසුරු කුසලතා සංකල්පය, ක්‍රීඩාවෙන් ඉගෙනුම (බ්ලොක් ක්‍රීඩාව) පිළිබඳ සංකල්පය, චලනයේ වැදගත්කම, එළිමහන් ක්‍රියාකාරකම්, අධ්‍යාපනයේ දෙමාපිය හා ගුරු භූමිකාව පිළිබඳව න්‍යායාත්මකව අදහස් ඉදිරිපත් කළේ ය. එමෙන්ම අධ්‍යාපනයේ ප්‍රායෝගික අංශය පිළිබඳව ද අදහස් දැක්වූ ෆ්‍රොබෙල් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය ඉදිරියට ගෙනයමින් ශිෂ්‍යයාට වැරදි කරමින් ඉගෙනීමට අවස්ථා ලබාදියයුතු බවත් ගුරුවරයා සුසාධ්‍යකරුවකු ලෙස පූර්ව ළමාවිය අධ්‍යාපනයේදී කටයුතු කළ යුතු බවත් පැහැදිලි කළේ ය. ඒ අනුව ලොව පුරා පුර්ව ළමාවිය අධ්‍යාපනය මෙන් ම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා ඒවායෙහි විෂය මාලාව සකස් විය යුතු අකාරය පිළිබඳ ඉදිරි දර්ශන ෆ්‍රොබෙල්ගේ අධ්‍යාපන දර්ශනයේ පවතින බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Asha, A. (2015). Kindergarten Philosophy-A General Summary. *Lokavishkar International E-Journal*, 4(2) (Retrieved May14 2024 From http://www.liirj.org)

Allen, Ann Taylor. (1982). Spiritual Motherhood: German Feminists and the Kindergarten Movement 1848-1911. *History of Education Quarterly* 22 (3): 319-339. Cambridge University Press, UK

Baidya, Mudassar Nazar., Mondal, Abhijit. Saha, Aniruddha. (2015). Educational Thoughts of Friedrich William A. Froebel: A Theoritical Study. *International Journal of Applied Research, 1*(2), 135-137, (Retrieved May24, 2024 From https://www.allresearchjournal.com)

Best. Ron. (2016). Exploring The Spiritual in The Pedagogy of Friedrich Froebel. *International Journal of Children's Spirituality, 21*, (3-4), (Retrieved May14, 2024 From https://www.researchgate.net)

Boss, M. A. (2014). *Child Development and Early Stimulation and Learning Resources*, (Retrieved May14 2024 From https://D3gxp3iknbs7bs.Cloudfront.Net).

Brehony, Kevin. J. (2013). Play, Work and Educatıon: Sıtuatıng A Froebelian Debate, *Bordón 65 (1), 2013*, 59-77. (Retrieved May17, 2024 From https://files.eric.ed.gov)

Bruce, Tina. (2012). *Early Childhood Practice: Froebel Today*, SAGE Publications Ltd, London, (Retrieved May 17, 2024 From https://www.google.lk/books)

Provenzo, Eugene. F. (2009), Friedrich Froebel's Gifts Connecting the Spiritual and Aesthetic to the Real World of Play and Learning. *American Journal of Play*, v2 n1 p85-99 Sum 2009 (Retrieved May14, 2024 From https://eric.ed.gov).

Frost, Joe. (2010). *A History of Children's Play and Play Environments: Toward A Contemporary Child-Saving Movement*, New York: Routledge

Hoskins, Kate. and Smedley, Sue. (2016). 'Life History insights into The Early Childhood and Education Experiences of Froebel Trainee Teachers 1952-1967' *History of Education, 45*(2), 206-224, (Retrieved May18,2024 From https://www.academia.edu).

Kahr, Bart. (2003). Crystal Engineering in Kindergarten, *Crystal Growth & Design, 4(1)*, (Retrieved May19, 2024 From https://www.researchgate.net)

Kibor, Esther. J. (2004). The Impact of Friedrich Froebel on Education Through 19th and 20th Centuries, *Africa Journal of Evangelical Theology*, (Retrieved May17, 2024 From https://biblicalstudies.org.uk).

Meta, T. (2015). *The Contributions of Preschool Education on The First Cycle Primary School Students Learning Process and Academic Achievement: Implications to Curriculum Development*. Department of Currıculum and Teacher's Professional Development Studıes. Addis Ababa University School of Graduate Studies. (Retrieved May14, 2024 From https://dergipark.org.tr).

McCann, Lauren. (2013). Learning From the Past to Inform Our Present: A Survey of the Evolution of Childhood and the Kindergarten, *July 2013, LEARNing Landscapes* 7(1):235-247 (Retrieved May 14, 2024 From https://www.researchgate.net).

Noddings, Nel. (2018). *Philosophy of Education*, 4th edition, Routledge, New York, USA (Retrieved May16" 2024 From https://www.lucy.cam.ac.uk).

Sacha Powell & Kathy Goouch (2015). *Special Songs. Nursery World*. Pp.16-17. (Retrieved May15, 2024 From https://www.froebel.org.uk).

Reinhold, S., Beutler, B., & Merschmeyer-Brüwer, C. (2013). Preschoolers count and construct: Spatial structuring and its relation to building strategies in enumeration-construction tasks. In A. Lindmeier & A. Heinze (Eds.), *Proceedings of the 37th Conference of the IGPME* (Vol. 4, pp. 81-88). (Retrieved May16, 2024 From https://files.eric.ed.gov).

Stephen J. (1994). *Froebel and Early Childhood Education Ġn America. Viewpoints* (Opinion/Position Papers, Essays, Etc.), (Retrieved May14 2024 From http://Files.Eric. Ed.Gov/Fulltext).

Tovey, Helen. (2013). *Bringing The Froebel Approach to Your Early Years Practice*. London: Routledge. (Retrieved May 14, 2024, from https://www.routledge.com).

Weston, Peter. (2000). *Friedrich Froebel: His Life, Times & Significance*. London, UK: University of Surrey Roehampton (Retrieved May14, 2024 From https://www.froebel.org.uk).